**නින්දවූර් ප්‍රාදේශීය සභාව - 2022**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

නින්දවූර් ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නින්දවූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.123,600 ක වත්කම්වල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඊළඟ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූලධන වියදම් ලෙස දැක්විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලැබූ රු.400,000 ක් වටිනා වරිපනම් හා බදු කළමනාකරණ පැකේජය මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් ලෙස දක්වා නොතිබුණි. | -එම- | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 10,456,949 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 12,716,011 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**2022** **2021**

| | | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 10,750,000 | 4,379,800 | 4,906,091 | 4,033,809 | 10,750,000 | 4,577,720 | 5,304,130 | 4,560,099 |
| ii. | කුලී | 21,420,000 | 6,963,096 | 6,963,096 | 3,173,466 | 18,320,000 | 10,033,792 | 10,033,792 | 3,173,466 |
| iii. | බලපත්‍ර ගාස්තු | 2,100,000 | 1,254,300 | 1,272,300 | - | 2,100,000 | 1,323,450 | 1,305,450 | 18,000 |
| iv. | වෙනත් ආදායම් | 5,025,000 | 1,445,976 | 1,445,976 | 2,477,322 | 6,025,000 | 2,750,030 | 2,750,030 | 2,477,322 |
| | එකතුව | 39,295,000 | 14,043,172 | 14,587,463 | 9,684,597 | 37,195,000 | 18,684,992 | 19,393,402 | 10,228,887 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ සියලුම ආදායම් රැස්කිරිමේ කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂය ආරම්භයේ හිඟහිටි වරිපනම් හා බදු රු.4,560,099 ක් වූ අතර වර්ෂයේ අයකර ගැනීම් රු.223,000 ක් විය. තවදුරටත් රු.4,033,809 ක් වර්ෂ 01 සිට 08 ක් දක්වා කාල පරාසයකින් හිඟ හිටිව පැවැතුණි. | හිඟහිටි අයකර ගැනීම් වර්තමානයේ සිදු කරමින් පවතින බව. | ආදායම් කඩිනමින් අය කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | **කුලී** | | |
| | 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දක්වා කඩකාමර 20 ක් කුලියට දීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සභාවට පසුගිය වර්ෂ 05 ක කාලයක් තුළ රු.1,068,000 ක ආදායම් අහිමි වී තිබුණි. | ඉදිරි කාලයේදී කඩකාමර කුලියට දීමට කටයුතු කරන බව. | කඩකාමර කුලියට දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.5,453,967 ක් අය විය යුතුව තිබුණි. | ඉදිරි කාලයේදී මුද්දර ගාස්තු ලබා ගැනීමට කටයුතු කරන බව. | මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට දෛනික කටයුතුවලින් ලැබෙන මුදල් හා චෙක්පත් ආරක්ෂිතව තබා ගැනීමට ආරක්ෂක සේප්පුවක් භාවිතා කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඉදිරි කාලයේදි මෙය සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | ආරක්ෂක සේප්පුවක් භාවිතා කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | වර්ෂ 03කට අධික කාලයක් අක්‍රීයව පැවැති එකතුව රු.71,522ක බැංකු ජංගම ගිණුම් 04ක ශේෂ එලදායී ලෙස යොදා ගෙන නොතිබුණි. | ඉදිරි කාලයේදි ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇත. | මුදල් එලදායී ලෙස යොදා ගත යුතුය. |
| (ඇ) | සභාව විසින් සමාලෝචිත වර්ෂයේ ජනතාවගෙන් ජල සම්බන්ධතාවය ලබාගැනීම වෙනුවෙන් කොන්ක්‍රීට්, තාර සහ ග්‍රැවල් මාර්ග කැපීමේ ගාස්තු රු.362,500ක් අයකර තිබූ නමුත් එම මාර්ග සභාව විසින් ප්‍රතිසංස්කරණය කර නොතිබූ අතර ඒ පිළිබඳ පොත්පත්ද නඩත්තු කර නොතිබුණි. | ඉදිරි කාලයේදි කටයුතු කරන බව. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2021 වර්ෂ කාලපරිච්ඡේදයේදී පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් පරිත්‍යාග ලැබූ වර්ග 07 ක අයිතමයන්ගේ වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඊළඟ වර්ෂයේ මූල්‍ය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | පරිත්‍යාග ලැබූ අයිතමයන්ගේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු වාහන 07ක් අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට වර්ෂ 05 කට අධික කාලයක් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. පිළිතුරු ලැබීමෙන් පසුව කටයුතු කරන බව. | වාහන අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදි විදුලි බල්බ 910 ක් සහ ටී.ටී වයර් කොයිල් 07ක් සැලැසුමකින් තොරව එක් වරකට වැඩි වාර සංඛ්‍යාවකදී මිලදී ගැනීමෙන් අදාල ප්‍රසම්පාදනයෙන් සැපයුම්කරුට වැඩිපුර රු.192,230ක් ගෙවා තිබුණි. | මෙ සම්බන්ධ දෝෂ ඉදිරියේදි නිවැරදි කරන බව. | අවශ්‍යතා ලැයිස්තුවක් සහ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට පියවර ගත යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ සේවක සංඛ්‍යාවෙහි පුරප්පාඩු 10ක් සහ අතිරික්ත සේවක සංඛ්‍යාව 13ක් සහ තාවකාලික සේවකයින් 25ක්ද ඇතුළුව සභාවේ සේවක අතිරික්තය 28ක් පැවැතුණි. ඔවුන් සුදුසු අයුරින් වැඩ බෙදීම් සිදුකර සභාවේ ආදායම් අංශය සහ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ අංශය වැනි ඒවාට යොදවා සභාවේ ආදායම් සහ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ මෙහෙයුම්වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට සභාව අපොහොසත් වී තිබුණි. | ඉදිරියේදි විධිමත් අන්දමින් බෙදීම් සිදුකර රාජකාරි සිදු කරන බව. | සුදුසු අයුරින් වැඩ බෙදීම් සිදුකර සභාවේ ආදායම් අංශය සහ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ අංශය වැනි අංශවලට යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ස්ථාන මාරුවී ගිය සහ සේවය හැරගිය සේවකයින් 12කගෙන් අයවිය යුතු හිඟණය රු.85,911 ක් අදාල පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | හිඟ ණය අය කර ගැනීමට පියවර ගන්නා බව. | හිඟ ණය අදාල පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට පියවර ගත යුතුය. |

### 4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

### 4.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට රු.4,280,970 ක වියදමින් කසල වෙන් කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කර තිබුණි. නමුත් සභා බලප්‍රදේශයේ පිහිටි කොට්ඨාශ 08 විසින් බැහැර කරනු ලබන කසල වෙන්කර එකතු කිරිමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | වර්තමානයේ වෙන්කර කටයුතු සිදු කරන බව. | වෙන් කිරිමට කටයුතු කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ වන රෙගුලාසිවලට අනුව බලපත්‍ර ලබා ගතයුතු කර්මාන්ත ආයතන 147ක් තිබූ නමුත් කර්මාන්ත ආයතන 82ක කල් ඉකුත් වූ බලපත්‍ර අලුත් කිරීමට සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඉදිරි කාලයේදී යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | කල් ඉකුත් වූ බලපත්‍ර අලුත් කිරීමට කටයුතු කළ යුතුය. |